**ශීර්ෂ 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---------------------------------------------------------------------

(අ) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

(ආ) අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

(ඇ) වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

(ඈ) කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

(ඉ) හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

**1.1 විගණන විෂය පථය**

--------------------

ඉහත 1 ඡේදයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුනි 19 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම්

හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 423.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 375.0 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 48.3 ක් හෙවත් සියයට 11 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 378.65 | 332.25 | 46.40 | 12.25 |
| මුලධන | 44.65 | 42.72 | 1.93 | 4.32 |
| **එකතුව** | **423.30** | **374.97** | **48.33** | **11.42** |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 2,604.37 ක් හා රු.මිලියන 438.51 ක් වශයෙන් රු.මිලියන 3,042.86 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 2,119.81 ක් හා රු.මිලියන 422.95 ක් වශයෙන් රු.මිලියන 2,542.76 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එක් අමාත්‍යාංශයක් විසින් දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත එවා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 2.23 කින් ඉක්මවා උපයෝජනය කර තිබුණි. අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දි තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 502.33 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26001 | 30.00 | 29.19 | 19.00 | 19.50 | 105.72 | 74.87 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 13.48 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 233.89 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.15 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය රැස්වීම් ශාලාව බෙදා වෙන්කිරීම් (පාටිෂන්) කොන්ත්‍රාත්තුව සඳහා ගොඩනැගිලි සම්මත රේට (BSR) වෙනුවට විශේෂ මිල ගණන් (SSR) යොදාගෙන ගෙවීම් කර තිබුණු අතර රු.4,832,561 ක ගෙවීම්වලට අදාල රේට විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 11 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 07 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.67,187,478 ක් විය. 2015 ජුලි 20 දින වන විට විගණන විමසුම් 05 කට තවදුරටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.14,149,182 ක් විය.

**3.4 විසර්ජන ගිණුම**

**3.4.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 62 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සඳහා ඉදිරිපත් කර තිබුණු හේතු පිළිගැනීමට නොහැකි විය.

(ඇ). ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් විසින් රු.122,080 ක් වැය කර මිලදී ගෙන තිබූ වත්කමෙහි වටිනාකම වැය විෂයන්ගේ ඉක්මවීම් වැළැක්වීම සඳහා වැය විෂයයන් දෙකක් උපයෝගී කර ගෙන ගෙවිම් කර තිබුණි.

**3.4.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර, එම ප්‍රතිපාදන උපයෝජනය කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික්කයේ ඉදිකිරිම් සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.1,969,281,924 ක මුලධන ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර එයින් රු.1,572,947,967 ක් වැය කරමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල පහක බල ප්‍රදේශ තුළ ව්‍යාපෘති 3,430 ක්‍රියාවට නංවා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම මුළු ප්‍රතිපාදනයෙන් රු.396,333,957 ක් හෙවත් සියයට 20 ක ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි. එසේ ක්‍රියාවට නංවා තිබුණු ව්‍යාපෘති 3,430 කින් ව්‍යාපෘති 525 ක් වර්ෂය අවසාන වන විට අවිච්ඡේද කර තිබුණි.

(ආ). ප්‍රමාණවත් මූල්‍ය වත්කමක් නොමැති සමිතිවල පූර්ව වාර්තා පරික්ෂා කිරිමකින් තොරව කොන්ත්‍රාත් පිරිනැමීම නිසා 2014 වර්ෂයේදී ආරම්භ කළ රු.16,012,478ක වටිනාකමැති බහු කාර්ය ගොඩනැගිලි 14 ක ඉදිකිරිම් 2015 අප්‍රේල් 30 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඇ). නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් රු.490,000 ක ඇස්තමේන්තු වටිනාකමින් ක්‍රියාත්මක කළ මෙරායා නගරයේ ත්‍රිරෝද රථ ගාල සංවර්ධනය කිරිමේ කර්මාන්තය

2014 දෙසැම්බර් 31 දින වන විට නිමකළ යුතු වුවද, එයින් මීටර් 40 කොටසක් විගණිත දිනය වු 2015 මැයි 20 දින වන විටත් නිම කර නොතිබුණි.

(ඇ). හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.990,000 ක වියදමින් හඟුරන්කෙත වැව පිවිසුමෙහි වාහන අංගනය ඉදිකර තිබුණද, වාහන අංගනය තුළ වාහන තුනකට වැඩි ප්‍රමාණයක් නවතා තැබිය නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.127,569,526 ක් වැය කර ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 469 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී 1: 2:4, 1: 2 1/2:5 හා 1:3:6 කොන්ක්‍රීට් මිශ්‍රණ යොදා තිබූ අතර, එම මිශ්‍රණවල ප්‍රමිතියේ නිවැරදිභාවය පිළිබඳව කිසිදු රසායනාගාර පරීක්ෂණයකට භාජනය කර නොතිබුණි.

(ඊ) ඉංජිනේරුවරයකුගේ අනුමත සැලැසුමකින් තොරව රු.1,964,000 ක ඇස්තමේන්තු වටිනාකමින් ඉදිකළ වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුංවත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ කුලුණු අතර පරතරය අඩි 22 ක් වීම නිසා කොන්ක්‍රීට් තට්ටුව මැදින් පහත් වී තිබුණි.

(උ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉංජිනේරු සැලැසුමකින් තොරව රු.597,054 කට ඇස්තමේන්තු කර තිබුණු හරංගල ගොවිජන සේවා මධ්‍යස්ථානය අසලින් යන මාර්ගයේ පාලමක් ඉදිකිරීමේ කර්මාන්තයෙහි කොන්ක්‍රීට් යෙදීම නියමිත ප්‍රමිතියට සිදු කර නොතිබුණි.

(ඌ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකළ මාර්ග 03 කට අදාලව යොදා තිබුණු ඉන්ටර්ලොක් කැටගල්වල ප්‍රමිතිය රසායනාගාර පරීක්ෂාවකින් පසු තහවුරු කර නොගෙන රු.1,333,951 ක් ගෙවා තිබුණි.

(එ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රිකිල්ලගස්කඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.1,980,000 කට ඇස්තමේන්තු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉංජිනේරු තාක්ෂණයට අනුකූල නොවන ලෙස බැවුම් සහිත ප්‍රදේශයේ මිමී16 කම්බි 6 ක් යොදා 1'×1' ප්‍රමාණයේ කුලුණු සහ මාර්ගය ආසන්නයේ මිමී16 කම්බි 4 ක් යොදා 9"×9" ප්‍රමාණයේ කුලුණු යොදා තිබුණි.

(ii) ඉදිකර තිබූ තලාද වක්වී පැවති අතර, කුලුණු සඳහා වන කොන්ක්‍රීට් මිශ්‍රණය 1:2:4 ප්‍රමිතියෙන් තොර විය.

(iii) බ්ලොක්ගල් බිත්ති 384.6m$^2$ බැඳීම් කළ බවට හා කපරාරු 70 m$^2$ ක් කළ බවට සාවද්‍ය වාර්තා ඉදිරිපත් කර 2014 දෙසැම්බර් 31 දින වන විට රු.555,964 ක බිල්පත් අනුමත කර තිබුණි.

(iv) ඉදිකිරීම් සඳහා රු.240,560 ක කොන්ක්‍රීට් භාවිතා කර තිබුණද, ඒවා නිසි පරිදි මිශ්‍ර කර තලා නොතිබුණි.

(ඒ) අඹගමුව බඳුපොල මීරියගහ මාර්ගයේ කොන්ක්‍රීට් ගල් ඇතිරීමේ කර්මාන්තය රු.198,000 ක් වැය කර ඉදිකර තිබුණත්, එම මාර්ගය සම්පූර්ණයෙන් ගිලා බැස තිබුණි.

(ඔ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුම්වුඩ් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් 31 දින සාර්ථකව නිම කළ බව ප්‍රකාශ කර රු.1,967,525 ක කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. විගණන දිනය වූ 2014 මැයි 20 දින වන විට මාර්ගය දැඩිව අබලන්ව පැවතුණි.

(ඕ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පෞද්ගලික නිවසකට යන ලක්ෂපාන පොම්ස්ෂට් මාර්ගය රු.297,000 ක් වැය කර කොන්ක්‍රීට් කර තිබුණි.

(ක) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යලය විසින් එදිරිසිංහ මාවතේ ඉන්ටර්ලොක් ඇතිරීමේ කර්මාන්තය සඳහා රු.519,058 ක් වැය කර තිබුණි. මේ සඳහා තත්ත්ව පරීක්ෂණයෙන් අසමත්වූ ඉන්ටර්ලොක් කැටගල් භාවිතා කර තිබුණි.

(කා) 2015 අප්‍රේල් 02 දින වන විටත් නිමකර නොතිබූ හඟුරන්කෙත වැව අඩිපාර කැටගල් අල්ලා සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා වන ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.1,980,000 ක් ගෙවීම සඳහා බිල්පත් සකස්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විසින් ගෙවීම් අනුමත කර තිබුණි.

(කැ) අඹගමුව බඳුපොළ මීරියගහ මුල මාර්ගය ඉදිකිරීමේ කර්මාන්තයේ ගිවිසුම අනුව මිමී20 කැටගල් යොදා ඉදිකිරීම් කළයුතු වුවද මිමී27.5 කැටගල් යොදා තිබියදී එයට රු.1,057,222 ක ඇස්මේන්තු වටිනාකම ගෙවා තිබුණි.

(කැ) අඹගමුව වැල්ලතැන්න සිට පොල්පිටිය දක්වා දිවෙන කෙටි මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා රු.388,000 ක් වැය කර තිබුණි. එම මාර්ගය සංවර්ධනය සඳහා මිමී20 කැටගල් යෙදිය යුතු වුවද, ඒ සඳහා මිමී37.5 කැටගල් යොදා තිබුණි.

(කි) අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මහ පතන පහළ කොටසේ මීටර් 1302 මාර්ගය සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.127,780 ක් ගෙවා තිබුණි. එම මාර්ගයේ දිග මීටර් 657 ක් පමණක් ඉදිකර තිබුණු අතර මාර්ගයෙහි කිසිදු රථවාහන ධාවන කටයුත්තක් සඳහා යොදා ගත නොහැකි වන ආකාරයට දැඩි බෑවුම් සහිතව නිමවා තිබුණි.

(කී) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ලිඳුල ආගරකන්ද කොටස අඩිපාර සංවර්ධනය කිරිමේ කර්මාන්තයේ කොන්ක්‍රීට් කිරිම වෙනුවෙන් සාවද්‍ය මිනුම් වාර්තා සකස් කර රු.218,948 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(කු) අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බ්ලැක්වෝටර් ඇල මාර්ගයේ පස් ඉවත් කිරිම යන්ත්‍ර යොදා ඉටුකර තිබුණද, එහි කොටසක් මිනිස් ශ්‍රමය යොදා ඉටුකළ බවට සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබියදී, ඒ සඳහා රු.156,876 ක් ගෙවා තිබුණි.

(කූ) හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ වැව පිවිසුමේ ආරක්ෂිත බැම්ම ඉදිකිරිමේ ව්‍යාපෘතියේ මැනුම්පතේ සඳහන් මිනුම් හා භෞතිකව නිරික්ෂණය කළ මිනුම් අතර වෙනස්කම් තිබියදී, එම මිණුම්වල නිවැරදිභාවය තහවුරු කර නොගෙන රු.990,000 ක් ගෙවා තිබුණි.

(කෙ) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හා හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කර්මාන්ත 04 ක කුට්ටිගල් (ඉන්ටර්ලොක්) ඇතිරිමේ කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්තු නිම විමෙන් පසු ලබාගන්නා ලද සාවද්‍ය රසායනාගාර වාර්තා පදනම් කර ගෙන රු.5,454,000 ක් ගෙවිම් කර තිබුණි.

(කේ) හඟුරන්කෙත වැව අඩිපාර කැටගල් අල්ලා සංවර්ධනය කිරිමේ කර්මාන්තය වෙනුවෙන් කුට්ටිගල් (ඉන්ටර්ලොක්) 743m$^2$ ඇතිරීම වෙනුවෙන් රු.864,000 ක ගෙවා තිබුණි. නමුත් කුට්ටිගල් 395m$^2$ පමණක් අතුරා තිබුණි.

(කො) අඹගමුව වග්ගම ප්‍රජා ශාලාව ඉදිකිරීම් සඳහා රු.990,000 ක් වැය කර තිබුණි. ඒ සඳහා ඉදිරිපත් කළ බිල්පතේ සඳහන් මිනුම් හා භෞතිකව ලබා ගත් මිනුම් අතර වෙනස්කම්

පැවැති අතර, එම මිනුම්වල නිවැරදිතාවය තහවුරු කර නොගෙන ගෙවීම් සිදු කර තිබුණි.

(කෝ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 08 ක් සඳහා එකතුව රු.5,140,000 ක් වැය කර තිබුණි. එම මාර්ග 08 පිළිබඳව සිදුකළ පරීක්ෂාවේදී මාර්ගවලට යොදා තිබුණු කොන්ක්‍රීට් නියමිත ප්‍රමිතියට අනුකූල බව රසායානාගාර පරීක්ෂණවලින් තහවුරු කර නොගෙන ගෙවීම් කර තිබුණි.

(ග) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල SLS ප්‍රමිති සහතිකය සහිත බ්ලොක් ගල් යොදා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණි. එකතුව රු.15,012,138 කට ඇස්තමේන්තු කර තිබුණු ගොඩනැගිලි 13 ක ඉදිකිරීම් සඳහා ප්‍රමිති සහතිකයකින් තොර බ්ලොක්ගල් භාවිතා කර ගෙවීම් කර තිබුණි.

(ගා) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් 12 කට අදාලව කොන්ත්‍රාත්කරු විසින් සපයා තිබුණු කුට්ටිගල් පිළිබඳව කොන්ත්‍රාත්කරු විසින්ම රැගෙන එන ලද රසායනාගාර පර්යේෂණ වාර්තා පදනම් කරගෙන රු.6,004,962 ක් ගෙවා තිබුණි.

(ගැ) හඟුරන්කෙත වැව අඩි පාරේ පාලම ඉදිකිරීමේ කර්මාන්තයේ පස් පිරිවීම, අත් වැට හා මාර්ගයේ කුට්ටිගල් ඇතිරීම යන වැඩ විෂයයන් එක් අයිතමයක් ලෙස සළකා රු.1,227,016 කට ඇස්තමේන්තු කර තිබුණි.

(ගෑ) හඟුරන්කෙත වැව අඩිපාර කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඉටු නොකළ කොන්ක්‍රිට් වැඩ සඳහා රු.105,688 ක් ගෙවා තිබුණි.

(ගි) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුංවත්ත ප්‍රජා ශාලාව දැඩි බෑවුම් සහිත භූමියක ඉදිකර තිබුණි. මේ සඳහා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2015 වර්ෂයේදී එම ඉදිකිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් විසින් කර තිබුණු නිර්දේශයන් 2015 ජුනි 30 දින වන විටත් අදාල කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර නොතිබුණි.

(ගී) නුවරඑළිය හා හඟුරන්කෙත ප්‍රදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් රුපියල් මිලියන 30 ක් වටිනා කොන්ත්‍රාත් 07 ක් රුපියල් මිලියන 2 කට අඩු වන පරිදි කොටස් 17 කට වෙන්කර ලියාපදිංචි සමිති වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

(ගු) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් එකතුව රු.1,084,399,860 ක වටිනා ව්‍යාපෘති 2608 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශයට

පටහැනිව (කමිටු නිර්දේශයකින් තොරව) අනුමත සමිතිවලට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

(ගු) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ එකතුව රු.1,980,000 ක් වටිනා ව්‍යාපෘති 02 ක් රුපියල් විසි දහසකට අඩු මූල්‍ය වත්කමක් සහිත සමිති වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ හෙයින්, එම කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් කාලය තුළ නිම කිරිමට නොහැකිව අවිච්ඡේද කර තිබුණි.

(ගෙ) 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 44(ඉ)(i) උපවගන්තිය ප්‍රකාරව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසු ස්වකැමැත්තෙන් ඉවත් වු සේවකයන්ට වන්දි හා පාරිතෝෂික ගෙවිම සඳහා එම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදිය යුතු වුවද, 2015 පෙබරවාරි මාසය වන විට ස්වකැමැත්තෙන් ඉවත් වු නිලධාරින්/සේවකයන් 49 දෙනෙකුට එකතුව රු.44,989,431 ක් සමිතිවල රැස්වූ මුදලින් ගෙවිම්කර තිබුණි. 2015 පෙබරවාරි 28 දින වන විටද එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. මුදල් ගෙවීමට ස්ථාවර තැන්පතු ඉවත් කර ගැනීමෙන් ප්‍රජා මූල සමිතිවලට 2015 පෙබරවාරි 28 දින වන විට රු.195,989 ක පොලී මුදලක් අහිමි වි තිබුණි.

(ගේ) හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම මූලස්ථානයට අනුබද්ධිත මකුරුප්ප සමෘද්ධි බැංකුව හා මහා සංගමය අතර 2001 අගෝස්තු 09 දින ඇති කර ගෙන තිබුණු ගිවිසුම අනුව අලෙවි ව්‍යාපෘති කටයුතු සඳහා පුද්ගලයින් 5 දෙනෙකු වෙත ගිවිසුමකින් තොරව රු.100,000 ක් බැගින් රු.500,000 ක ණය මුදල් ලබා දි තිබුණත්, එම ණය මුදල් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ගො) ආර්ථික සංවර්ධන අමාත්‍යාශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලැසුම් අංශයට අනුයුක්ත කර තිබුණු එම අංශයේ සේවය නොකළ මහජන නියෝජිතයකුට හා සේවය සපයන නිලධාරින් දෙදෙනෙකු වෙනුවෙන් 2010 - 2014 කාලපරිච්ඡේදය තුළදී රු.1,785,530 ක් වැටුප් ගෙවා තිබුණි.

(ගෝ) 2014 ඔක්තෝබර් 30 දිනැති අංක 2014/11 දරන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම්වල සහනාධාරලාභින්ගේ ඉතිරුම්වලින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් යටතේ දිවිනැගුම සහනාධාලාභින් 25,883 ක් වෙත රු.64,707,500 ක් ගෙවා තිබුණි. එම ගෙවිම් 2015 ජනවාරි 30 දින වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන

නොතිබුණි. තවත් සහනාධාරලාභින් 12,022 ක් සඳහා ගෙවිය යුතු රු.30,055,000 ක් 2015 පෙබරවාරි 28 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ච) පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් 2014 මාර්තු 06 දින රු.7,216,459 ක් වැය කර මිලදී ගෙන තිබුණු භාණ්ඩ අයිතම 454 ක් 2015 ජනවාරි මාසය වන විටත් ජනතාව වෙත බෙදා දී නොතිබුණි.

(ජ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 24 අනුව දිරියමාතා ගිණුම් ආරම්භ කිරිමේ අරමුණු හා ඉලක්ක සපුරා ගත යුතු වුවද, හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දිරිය මාතා ගිණුමේ පැවති රු.2,514,911 ක් 2015 මාර්තු 31 දින වන විටත් අක්‍රියව පැවැතුණි. ඒ බව විගණනයෙන් පෙන්වා දුන් පසු ගිණුම් 4807 කින් ගිණුම් 214 ක් පමණක් සක්‍රිය කර තිබුණි.

(න) හඟුරන්කෙත ප්‍රජා මූල බැංකු 10 ක එකතුව රු.18,821,457 ක් වටිනා කොටස් මුදල් හා තැන්පත් 2015 මාර්තු 31 දින වන විටත් අක්‍රියව පැවතුණි. විගණනයෙන් පෙන්වා දුන් පසු ගිණුම් 13,573 කින් 330 ක් පමණක් සක්‍රිය කර තිබුණි.

(නා) දිවිනැගුම ජිවනෝපාය හා දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩ සටහන් 2014 සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපාතිය ඉටුකිරිම සඳහා නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට රු.4,066,500 ක ප්‍රතිපාදන ලබා දි තිබුණි. පුද්ගලයන් 184 කගේ විවිධ ව්‍යාපෘති වර්ග 18 ක් ක්‍රියාවට නැංවිම සඳහා රු.4,052,137 ක් වැය කිරිමට හඳුනාගෙන තිබුණි. 2015 අප්‍රේල් 15 දින වන විටත් එම මුදල් අදාළ ව්‍යාපෘති ඉටු කිරිමට උපයෝජනය නොකර දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල රඳවා ගෙන තිබුණි.

(ii) කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට ලබාදි තිබුණු රු.14,982,250 ක් වැය කර විවිධ ව්‍යාපෘති 567 ක් ක්‍රියාවට නැංවිමට හඳුනාගෙන තිබුණි. එම මුදලින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.3,465,265 ක් ගව පැටවුන්, එළු පැටවුන් සහ කුකුල් පැටවුන් මිලදි ගැනිම සඳහා බාහිර ආයතන වෙත ගෙවා තිබුණද, එම සතුන් මාස 05 ක ප්‍රමාදයකින් පසු 2015 මැයි මාසයේදී අදාළ ප්‍රතිලාභින් වෙත ලබාදි තිබුණි.

(iii) 2014 දෙසැම්බර් 31 දින රු.3,088,480 ක වටිනා චෙක්පත් 11 ක් දිවිනැගුම ප්‍රජා මූල බැංකු 06 ක් වෙත ලියා එය වැය විෂයයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණත්, ප්‍රතිලාභින් වෙත එම මුදල් ගෙවා නොතිබුණි.

(iv) මාළු පැටවුන් කොත්මලේ ජලාශය වෙත මුදා හැරීම සඳහා රු.497,500 ක් ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත 2014 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. 2015 ජුනි 30 දින වන විටත් රු.35,218 ක් වටිනා මාලු පැටවුන් ජලාශය වෙත මුදා හැර නොතිබුණි.

(තැ) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2014 විමධ්‍යගත අයවැය යටතේ ක්‍රියාත්මක කළ යුතු රු.700,000 ක් වූ ද්‍රව්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘති 10 ක් 2015 මාර්තු 24 දින වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.5 අග්‍රිම ගිණුම්

2015 අප්‍රේල් 30 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.791,693 ක් වී තිබුණි. එම ශේෂය 2012 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

## 3.6 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ(ඉඩම් තැන්පතු හැර) එකතුව රු16,523,869 ක් වූ තැන්පතු 376 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව තැන්පතු ලෙජරය තුලනය කර කේවල ශේෂ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව තැන්පත් ලෙජරය අවසානයේ වූ තුලන ගිණුම පිළියෙල කර එහි ශේෂය සැකැසී ඇති අන්දම දැක්වෙන පරිදි තැන්පතු ලෙජරයේ ගිණුම්වල වූ ශේෂ සාංරාංශය කර පිළියෙල කර එක් මාසය අවසන් වී ඊ ළග මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ). මුදල් රෙගුලාසි 569 ප්‍රකාරව තැන්පතු වර්ගීකරණය කර නොතිබුණි.

(ඉ). විසර්ජන ගිණුමේ දක්වා තිබූ පොදු තැන්පත් ගිණුමේ ශේෂය හා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබූ පොදු තැන්පත් ගිණුම් වල ශේෂ එකතුව අතර රු.31,679,147 ක වෙනසක් පැවැතුණි.

### 3.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 26001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.534,673 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 08 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ). 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ). අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.387,507 ක හඳුනා නොගත් ශේෂයක් පැවැතිණි.

### 3.8 වත්කම් කළමනාකරණය

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| (i) | ගොඩනැගිලි | 01 | 07 |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | 02 | 5 වැඩි |

(iii). වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදා හේතුවෙන් පීඩාවට පත් ජනතාවට බෙදා හැරීමට ලැබී තිබූ සාස්පාන් තොගයක් වර්ෂ ගණනාවක සිට ගබඩා කර තිබූ අතර ලැබුණු වර්ෂය, කාගෙන්ද හා ලැබී තිබුණු ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv). අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති යටතේ 2013 හා 2014 වර්ෂවලට අදාල මිලදි ගෙන තිබුණු රු. 6,492,474 ක් වටිනා භාණ්ඩ අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර බෙදා හැර අවසන් කළ යුතු වුවද, එසේ කටයුතු නොකර ගබඩාවේ හා කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි.

(v). කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති 264 ක් සඳහා රු.6,698,008 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණද , 2015 මැයි 30 දින තෙක් මෙම භාණ්ඩ ප්‍රතිලාභින් වෙත බෙදාදි නොතිබුණි.

(vi). නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේදි මිලදි ගෙන තිබු රු.605,095 ක් වටිනා භාණ්ඩ ඒකක 03 ක් සහ මහජන නියෝජිතයින්ගේ විශේෂ ව්‍යාපෘති යටතේ 2014 වර්ෂයේදි මිලදි ගෙන තිබුණු රු.781,779 ක් වටිනා භාණ්ඩ ඒකක 02 ක් 2015 ජුලි 20 දින වන විටද අදාල ප්‍රතිලාභින්ට බෙදා හැර නොතිබුණු අතර එම භාණ්ඩ කාර්යාලයේ නිෂ්කාර්යව පැවැතුණි.

(vii). වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ 2013 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.774,646 ක වටිනා භාණ්ඩ අයිතම 07ක්, 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.687,997 වටිනා භාණ්ඩ අයිතම 06 ක් සහ පළාත් නැගුම වැඩසටහන යටතේ පානීය ජල යෝජනා ක්‍රම සංවර්ධන කිරීම සඳහා වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු1,905,527 ක් වටිනාකමැති ජල මනු 530ක් 2015 අප්‍රේල් 08 දින දක්වා ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩා කර තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වසර 13 ක කාලයක සිට කර්යාලය සතු ගොඩනැගිල්ලක් මධ්‍යම පළාත් සභාව වෙත මුදාහැර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන රු.1,661,831 ක් වූ බැරකම් පැවැතුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94 හි සඳහන් විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 5 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.395,873 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ii) අවස්ථා 05 කට අදාලව එකතුව රු.159,755 ක බැරකම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

## 3.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිති,රිති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවිම් |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| VIII පරිච්ඡේදයේ 4.1 වගන්තිය. | 10,642 | ක්ෂේත්‍ර නිලධාරින් 6 දෙනෙකුට අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 237 | 3,220,785 | වවුචර් සහතික කිරිම සඳහා ඇමිණිය විශේෂ සහතික නොමැතිව ලියන ලද චෙක්පත් 37 ක් 2015 මාර්තු 12 දින වන විටත් අත රඳවා ගෙන තිබුණි. |

(ii) මුදල් රෙගුලාසි 1641 . - අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අයත් කැබ් රථයක් 2009 මැයි 19 දින අනතුරට ලක් වීමෙන් පසු අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර වර්ෂ 5ක පමණ කාලයක් නිෂ්ක්‍රියව පෞද්ගලික ගරාජයක ගාල් කර තිබුණි.

## 3.10 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ප්‍රදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ යුතු දින වකවානු | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| (i) | නුවරඑළිය | 05 | 297,268,000 | 2014.10.01 දින සිට 10.15 දින දක්වා | ගිවිසුම් අත්සන් කර නොතිබීම, පළාත් පාලන ආයතනයට පවරා නොතිබිම හා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා නොගැනීම. |
| (ii) | කොත්මලේ | 33 | 14,100,000 | 2014.07.16 දින සිට 12.22 දින දක්වා | තාක්ෂණික ගැටළු, මහජන විරෝධය, කොන්ත්‍රාත්කරු ආරම්භ නොකිරිම, මාර්ගය කැපීමට නොහැකි විම, ඇස්තමේන්තු ඉදිරිපත් නොවිම, දේශපාලන අධිකාරිය විසින් ව්‍යාපෘතිය සංශෝධනය කිරීම හා සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිම |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | වලපනේ | 21 | 4,600,000 | 2014.01.10 දින සිට 2014.11.10 දින දක්වා | පෞද්ගලික ඉඩමක් මැදින ඉදිවීම, කොන්ත්‍රාත්කරු කටයුතු ආරම්භ නොකිරීම, ගිවිසුම්වලට එළඹීමට අදාල සමිති එකඟ නොවීම, දිසා වන නිලධාරීගේ නිර්දේශ නොලැබීම හා ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්වීමත් සමඟ ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීම් නැවැත්වීම. |
| (iv) | හඟුරන්කෙත | 15 | 6,575,000 | ව්‍යාපෘති 2 ක ආරම්භ කළ යුතු දිනය ලෙස 2014.12.15 දිනය දක්වා තිබුණු අතර, අනෙක් ව්‍යාපෘති සඳහා දිනයන් දක්වා නොතිබුණි. | යෝජිත භූමිය අවධානම් සහිතවීම, අයහපත් කාලගුණය, ජල මූලාශ්‍රය පිහිටි ස්ථානයේ අයිතිය පිළිබඳ ගැටළු පැවැතීම, මුල් ව්‍යාපෘතිය සංශෝධනය කිරීම නිසා සංශෝධිත ව්‍යාපෘතියට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා පිවිසුම් මාර්ගය පෞද්ගලික ඉඩමක් හරහා පැවැතීම. |
| (v) | අඹගමුව | 16 | 3,450,000 | ව්‍යාපෘති 2 ක් 2014.11.04 දිනද, තවත් ව්‍යාපාතියක් 2014.11.11 දින දක්වා තිබුණු අතර අනෙක් ව්‍යාපෘති 13 හි ආරම්භක දිනයන් සඳහන් කර නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, වෙනත් ව්‍යාපෘතියක් මගින් ප්‍රතිපාදන සළසා තිබුණු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබීම හා භාණ්ඩ ලබා ගැනීමට නොහැකිවීම. |
| | | ------ | -------------- | | |
| | **එකතුව** | **90** | **325,993,000** | | |
| | | === | ======== | | |

## 3.11 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3(ඇ) මාර්ගෝපදේශයට පටහැනිව 2014 සැප්තැම්බර් 30 දින වන විටත් කොත්මලේ ප්‍රදේශිය ලේකම්

කාර්යාල භූමිය නිත්‍යානුකූලව පවරා නොගෙන 2013 හා 2014 වර්ෂවල එම භූමියේ නිල නිවාස දෙකක් එකතුව රු.10,066,970 ක ගිවිසුම්ගත වටිනාකමක් මත ඉදිකෙරෙමින් පැවතුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව බෙදා වෙන් කිරීමේ ව්‍යාපෘති 2 ක් එකතුව රු.5,719,200 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5(අ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසු කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 හා 5.4.9 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයන් ලබා ගෙන නොතිබුණි.

## 3.12 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉහළ මහල ඉදිකිරිමේ II අදියර යටතේ ගොඩනැගිල්ලේ පෙර පැවති කුලුණු 2 ක් සඳහාද නැවත ගෙවිම් කිරීමට කටයුතු කිරීමෙන් රු. 41,259 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉහළ මහල ඉදිකිරිම් ii අදියරේදි වහල සඳහා 8062.65 Kg ක යකඩ සඳහා ගෙවීම් කර තිබුණත්, යකඩ 7712 Kg ක් පමණක් යොදවා තිබුණු බැවින්, රු. 96,250 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවට යොමුව** | | **යොමුගත විෂය** |
| --- | --- | --- |
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 1.8.(අ)VII | අවිධිමත් ගනුදෙනු. |
| 2013 | 1.7. (අ) I, II | වත්කම් කළමනාකරණය. |
| 2013 | 1.7 (ඇ) | වත්කම් කළමනාකරණය |
| 2013 | 1.8(අ) V. II | අනුකූල නොවිම්. |
| 2013 | 1,14 .III | කළමනාකරණ දුර්වලතා. |

## 3.14 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ). නුවරඑළිය රාජ්‍ය පරිපාලන නිවාඩු නිකේතනය භාරකරුවන්ගේ නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2012 අප්‍රේල් 04 දින ලබාදුන් අත්තිකාරම 2015 පෙබරවාරි 25 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ). 2014 වර්ෂයේදී රාජ්‍ය සේවා නිවාස 66 හි අලුත්වැඩියා කටයුතු සඳහා වැය කරන මුදල මෙන් සියයට 944 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින් තිදෙනෙකුගේ නිල නිවාස අලුත්වැඩියාව සඳහා වැය කර තිබුණි.

(ඇ). අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉහල මහල ඉදිකිරිමේ කර්මාන්තයේදි ගොඩනැගිල්ලේ වහලයට සින්ක් ඇලුමිනියම් තහඩු භාවිතා කර තිබුණෙන් රස්නය අවම කිරීම සඳහා මැක්ෆොයිල් යෙදීම අත්‍යවශ්‍ය වුවද මැක්ෆොයිල් යෙදිමකින් තොරව වහල නිමකර තිබුණු බැවින් සහ විවෘත කළ නොහැකි ජනේල යෙදීම හේතුවෙන් ගොඩනැගිල්ල වැඩි පිරිසක් ගැවසෙන අවස්ථාවකදි භාවිතා කිරීම දැඩි අපහසුතාවයක් පවතිනු ඇති බව නිරික්ෂණය විය.

(ඈ). මසකට රු.193,840 මුදලක් වැය කරමින් ඉංජිනේරු ඒකකයක් නඩත්තු කලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව බෙදා වෙන් කිරීමේ කර්මාන්තය හා බිම්මහලේ කාර්යාල පරිශ්‍ර වෙන් කිරීමේ ඇස්තමේන්තු ප්‍රසම්පාදන පිරිනැමු කොන්ත්‍රාත්කරු ලවා සකස් කරගෙන තිබුණි.

(ඉ). වසර 5 - 26 දක්වා කාලයක් තුළ සිදුව තිබු වාහන අනතුරු 4 කට අදාල රු.550,255 ක අලාභයක් කපා හැරිමට හෝ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඊ). එකතුව රු.129,720 ක් වු වත්කම් 3 ක වටිනාකම වැඩියෙන් දක්වා තිබුණු අතර, වත්කම් 5 ක එකතු වටිනාකමින් රු.95,000 ක්වු මුදලක් විසර්ජන ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

3.15 **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 19 | 10 | - |
| (ii) තෘතියික මට්ටම | 15 | 12 | 03 | - |
| (iii) ද්විතියික මට්ටම | 748 | 665 | 83 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 80 | 83 | - | 03 |
| **එකතුව** | **872** | **779** | **96** | **03** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 96 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ). 2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශිය ලේකම් ලේකම් කාර්යාල 5 න් 3 ක ගණකාධිකාරි තනතුර පුරප්පාඩුව පැවතිණි. එම තනතුරේ පුරප්පාඩු පැවතීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනයට සෘජුවම බලපාන බව නිරික්ෂණය විය.